කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

*දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය*

**වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය**

ව්‍යාපාර කළමනාකරණවේදී (සාමාන්‍යය) උපාධි පළමු පරීක්ෂණය (බාහිර) - 2015

සැප්තැම්බර් - 2020

**BMGT E 1045 - ව්‍යාපාර නීතිය**

ප්‍රශ්න සංඛ්‍යාව : අටයි (08) කාලය : පැය 03 යි

ඕනෑම ප්‍රශ්න **පහකට (05)** කට පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න අංක 01**

අ) වලංගු ගිවිසුමක තිබිය යුතු මූලිකාංග පහක් නිදසුන් ඇසුරින් දක්වන්න.

(ලකුණු 10)

ආ) අජිත් තමා සතු ඉඩමක් නිමල් වෙත රු. මිලියන 10 කට විකිණීම සඳහා අර්පනයක් ඉදිරිපත් කරයි. අදාල අර්පනය පිළිගත් නිමල් එම ප්‍රතිග්‍රහණය සහිත ලිපිය සමඟ රු. මිලියන 05 ක චෙක්පතක් එවූ අතර ඉතිරි මුදල රු. මිලියන 01 බැගින් වූ මාසික වාරික පහකින් ගෙවීමට පොරොන්දු විය. ඉන් අනතුරුව අජිත් එම ඉඩම නිමල් වෙත විකිණීම ප්‍රතික්ෂේප කළේය. අජිත් සහ නිමල් අතර ගිවිසුමක් හටගත්තේ දැයි විස්තර කරන්න.

(ලකුණු 10)

**(මුළු ලකුණු 20)**

**ප්‍රශ්න අංක 02**

අ) "ගිවිසුමක් පොරොන්දු වූ පරිදි ඉටුකිරීමට නොහැකි වීමේ වගකීම මුළුමනින්ම හෝ යම්තාක් දුරකට බැහැර කිරීමට වගකීම් අත්හැරීමේ වගන්ති හඳුන්වා දීමෙන් විකුණුම්කරුවෙකු බලාපොරොත්තු වේ."

ගිවිසුම් සෑදීමේදී වගකීම් අත්හැරීමේ වගන්ති ඇතුලත් කිරීම සම්බන්ධයෙන් විකුණුම්කරුවෙකු විසින් අනුගමනය කළ යුතු විධිවිධාන මොනවාදැයි කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 10)

ආ) ඇන්ට, ඩේවිඩ් වෙතින් මෝටර් රථයක් මිලදී ගැනීමට අවශ්‍ය විය. අදාල රථය 2015 වර්ෂයේදී නිෂ්පාදිත බවත්, තමා එහි පළමු හිමිකරු වන බවත්, ඩේවිඩ් ඇන්ට පවසයි. රථය මිලදී ගැනීමෙන් අනතුරුව ඇන්ට දැන ගැනීමට ලැබුනේ අදාල රථය 2010 වසරේදී නිෂ්පාදිත බව සහ ඩේවිඩ් එම රථයේ සිව්වන හිමිකරු වන බවය. දැන් ඩේවිඩ්ට විරුද්ධව නඩු පවරා අදාල ගිවිසුම අහෝසි කර ගැනීමට ඇන්ට අවශ්‍යව ඇත. විනිශ්චිත නඩු තීන්දු කෙරෙහි අවධානය යොමු කරමින් ඇන්ට උපදෙස් දෙන්න.

(ලකුණු 10)

**(මුළු ලකුණු 20)**

**ප්‍රශ්න අංක 03**

අ) කසුන්, වටිනා ඇඳුමක් මහේලිගේ උපන්දිනය සඳහා ඇයට තෑගි කරයි. මෙම ඇඳුම, ඇඳීමෙන් පසු ඇයට චර්ම රෝගයක් වැළඳුනි. අදාල ඇඳුම, කසුන් විසින් ස්ටාර් ෆැෂන් වෙතින් මිලදී ගත් අතර එහි ගැණුම් කළමනාකරු, කසුන් මිලදී ගත් ඇඳුමද ඇතුළුව ඇඳුම් තොගයක් සාම්පල් පරීක්‍ෂා කිරීමෙන් අනතුරුව රන්ලිය ගාමන්ට් වෙතින් මිලදී ගෙන තිබුණි. වෛද්‍යවරුන් සොයා ගනු ලැබුවේ, අදාල ඇඳුම නිර්මාණය සඳහා යොදාගත් රෙදිවල තිබූ දෝෂයක් නිසා මෙම චර්ම රෝගය හටගත් බවයි. සිය අයිතිවාසිකම් සහ වගකීම් පිළිබඳ, කසුන්, මහේලි, ස්ටාර් ෆැෂන්ස් සහ රන්ලිය ගාමන්ට් වෙත උපදෙස් දෙන්න.

(ලකුණු 10)

ආ) භාණ්ඩවල අයිතිය විකුණුම්කරුගෙන්, ගැනුම්කරු වෙත මාරු වන අවස්ථාවට අදාල වන, භාණ්ඩ විකිණීමේ ආඥා පනතෙහි සඳහන් රීති පහ දක්වන්න.

(ලකුණු 10)

**(මුළු ලකුණු 20)**

**ප්‍රශ්න අංක 04**

අ) හවුල් ව්‍යාපාරයක වාසි සහ අවාසි මොනවාද?

(ලකුණු 06)

ආ) 1890 හවුල් ව්‍යාපාර ආඥා පනත කෙරෙහි අවධානය යොමු කරමින් හවුල් ව්‍යාපාරයක ගති ලක්‍ෂණ දක්වන්න.

(ලකුණු 08)

ඇ) අධිකරණයේ මැදිහත් වීමකින් තොරව හවුල් ව්‍යාපාරයක් විසුරුවා හරින අවස්ථා මොනවාදැයි දක්වන්න.

(ලකුණු 06)

**(මුළු ලකුණු 20)**

ප්‍රශ්න අංක 05

ආ) අපරානුමැතිය මත නියෝජ්‍යත්වය යනු කුමක්ද? වලංගු අපරානුමැතියක් උදෙසා සපුරාලිය යුතු පූර්ව කොන්දේසි මොනවාද?

(ලකුණු 10)

ආ) නියෝජිතයෙකු සතු යුතුකම් පහක් සුදුසු නිදසුන් ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

**(මුළු ලකුණු 20)**

ප්‍රශ්න අංක 06

අ) "ගණුදෙනු කළ හැකි ලියවිල්ලක" මූලික ලක්‍ෂණ මොනවාද?

(ලකුණු 06)

ආ) "ගණුදෙනු කළ නොහැක" සහ "ආදායකයාගේ ගිණුමට පමණයි" යනුවෙන් සටහන් කර රේඛනය කරන ලද චෙක්පත් දෙකක් අතර ඇති ප්‍රධාන වෙනස කුමක්ද?

(ලකුණු 06)

ඇ) සුප්‍රසිද්ධ කේවල ස්වාමි ව්‍යාපාරයක් හිමි, අප්පුහාමි යටතේ සේවකයෙකු ලෙස සේවය කළ රොහාන් දිනක් අප්පුහාමිගේ චෙක්පොතින් චෙක්පතක් සොරාගෙන එහි මුදල් ප්‍රමාණය රු. 100,000/= ලෙස සඳහන් කොට, අප්පුහාමිගේ අත්සන වංචනික ලෙස යෙදීය. ඉන් අනතුරුව ලිබර්ටි මෝටර්ස් ආයතනයෙන් මිලදී ගත් පාපැදියක් සඳහා එම චෙක්පත ලබාදුනි. ලිබර්ටි මෝටර්ස් ආයතනය විසින් අදාල චෙක්පත බැංකුව වෙත ඉදිරිපත් කළ අතර ඊට මුදල් ගෙවීම බැංකුව විසින් ප්‍රතික්ෂේප කරන ලදී. ලිබර්ටි මෝටර්ස් ආයතනය මෙම චෙක්පත සම්බන්ධයෙන් යථාකාල ධාරයෙක්දැයි දක්වන්න.

(ලකුණු 08)

**(මුළු ලකුණු 20)**

**ප්‍රශ්න අංක 07**

අ) පහතින් සඳහන් දෑ පිළිබඳව අවධානය යොමු කරමින් 1954 අංක 19 දරන සාප්පු හා කාර්යාල සේවක පනත පිළිබඳව සටහනක් ලියන්න.

i. වැඩකරන පැය ගණන
ii. පොදු නිවාඩු
iii. වාර්ෂික නිවාඩු
iv. අනියම් නිවාඩු
v. පත්වීමේ ලිපිය
vi. මාතෘ ප්‍රතිලාභ

**(මුළු ලකුණු 20)**

ප්‍රශ්න අංක 08

අ) 1935 අංක 14 දරන වෘත්තීය සමිති ආඥා පනතට අනුව වෘත්තීය සමිතියක අරමුණු කවරේද?

(ලකුණු 04)

ආ) වෘත්තීය සමිති සකස් කර ගැනීම සඳහා අයිතිවාසිකම් නොමැති සේවකයින් කවුරුන්ද?

(ලකුණු 04)

ඇ) වෘත්තීය සමිතියක් ලියාපදිංචි කිරීමේ ක්‍රියාපටිපාටිය දක්වන්න.

(ලකුණු 06)

ඈ) ලියාපදිංචි වෘත්තීය සමිතියක් සතු අයිතිවාසිකම් සහ වගකීම් මොනවාද?

(ලකුණු 06)

**(මුළු ලකුණු 20)**